මගේ අංකය : JSC/SEC/CIR/2021

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් හා අධිකරණ නිළධාරීන් වෙත,

**<u>අධිකරණ නියෝගයන් මගින් විදේශ ජාතික වූදිතයින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ රඳවුම් මධ්‍යස්ථාන වෙත යොමු කිරීම.</u>**

ශීර්ෂගත කරුණට අදාළව අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති) පියුමන්ති පීරිස් මහත්මියගේ අංක MOJ/L/1/2/(Misc) හා 2021.09.16 දිනැති ලිපිය (ඇමුණුම 01) සමඟ මා වෙත යොමු ඇති රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් යූ.කේ.බණ්ඩාර මහතාගේ අංක IA/1/3/3/5 හා 2021.09.14 (ඇමුණුම 02) ලිපියද ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල් යූ.වී.සරත් රූපසිරි මහතාගේ අංක DIE/INV/92 හා 2021.08.17 (ඇමුණුම 03) යන ලිපියද යන ලිපි පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, එම ලිපි ඔබගේ අවධානයට ලක් කිරීමට කටයුතු කරන ලෙසට මට නියම කර ඇත.

02. අදාල ලිපිවල පිටපත් මේ සමඟ අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2021 ඔක්තෝබර් මස 08 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

පිටපත් : ලේකම්, අධිකරණ අමාත්‍යාංශය , කොළඹ 12.
<u>අවධානය:</u> පියුමන්ති පීරිස් මහත්මිය, අතිරේක ලේකම් (නිති) - දැ.ගැ.ස.

ඇමුණුම 01


ලේකම් / செயலாளர் / Secretary — Telephone
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk
ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථන / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785
*Web Site: www.moj.gov.lk*


# අධිකරණ අමාත්‍යාංශය
# நீதி அமைச்சு
# MINISTRY OF JUSTICE


ටෙලිමෙයිල් / ரெலிமெயில் Secminjust
තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box. 555
ඉලෙක්ට්‍රෝනික තැපැල / மின்அஞ்சல் / E-mail info@moj.gov.lk
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12
மீயுயர் நீதிமன்ற கட்டிடத்தொகுதி
கொழும்பு 12
Superior Courts Complex,
Colombo 12.


මගේ අංකය / எனது இல / My No. MOJ/L/1/2/(Misc)

ඔබේ අංකය / உமது. இல. / Your No.

දිනය / திகதி / Date 2021.09. 16

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT, COLOMBO 12
B/H
16 SEP 2021

සංජීව සෝමරත්න මයා
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

<u>**අධිකරණ නියෝගයන් මගින් විදේශ ජාතික චූදිතයින් ආගමන හා විගමන දෙපාර්තමේන්තු රැඳවුම් මධ්‍යස්ථාන වෙත යොමු කිරීම.**</u>

ඉහත ශීර්ෂ යටතේ IA/1/3/3/5 හා 2021.09.14 දිනැති ලිපිය මගින් රාජ්‍ය ආරක්ෂක හා ආපදා කලමණාකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් එවන ලද ලිපිය සහ ඇමිණුම මේ සමඟ අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

පියුමන්ති පීරිස්
අතිරේක ~~ලේකම් (නීති)~~
අධිකරණ අමාත්‍යාංශය

ඇමුණුම 02

# රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
## தேசிய பாதுகாப்பு மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சு
## State Ministry of National Security and Disaster Management


විද්‍යා මාවත, කොළඹ 07.
வித்யா மாவத்தை, கொழும்பு 07
Vidya Mawatha, Colombo 07.

ලේකම් / செயலாளர் / Secretary — දුර./Tel./தொ.பே. : 0112 665 389; ෆැක්ස්/Fax/தொ.ந. : 0112 665 098

කාර්යාලය / அலுவலகம் / Office — දුර./Tel./தொ.பே. : 0112 665 298; ෆැක්ස්/Fax/தொ.ந. : 0112 665 296; ඊ.තැ./Email/மின்னஞ்சல் : secoffice@smnd.gov.lk

වෙබ් අඩවිය/Website/இணையத்தளம் : www.dtr.dmc.gov.lk


මගේ අංකය / எனது இல / My No: IA/1/3/3/5 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2021.09. 14

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12.

RECEIVED
15 SEP 2021
Secretary's Office
Ministry of Justice

**<u>අධිකරණ නියෝගයන් මගින් විදේශ ජාතික වූදිතයින් ආගමන හා විගමන දෙපාර්තමේන්තු රැඳවුම් මධ්‍යස්ථාන වෙත යොමු කිරීම.</u>**

උක්ත මැයෙන් අංක DIE/INV/92 හා 2021.08.17 දිනැතිව ආගමන හා විගමන පාලක ජනරාල්වරයා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය හා බැඳේ. ( එම ලිපිය මේ සමඟ අමුණා ඇත.)

02. එම ලිපියෙන් ඉල්ලා ඇති පරිදි මින් ඉදිරියට අධිකරණ නියෝග අනුව වැරදිකරුවන් වූ විදේශිකයන් රටින් ඉවත් කරන තෙක් රැඳවීමට, සංශෝධිත 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනතේ (351 වන අධිකාරය) 48 වන වගන්තිය අනුව රැඳවියන් ආගමන හා විගමන දෙපර්තමේන්තුව වෙත යොමු කිරීමේ දී, අමාත්‍යවරයා විසින් අනුමත කොට ඇති ඇලපිටිවල ග්‍රාම නිලධාරී වසමේ මිල්ලගහවත්ත රැඳවුම් මධ්‍යස්ථානයට ද, වැලිසර පිහිටි නව මධ්‍යස්ථානයට හා මිරිහාන පිහිටි මධ්‍යස්ථානය යන මධ්‍යස්ථානවලට රැඳවියන් භාරදීමට හැකිවන ලෙස, අධිකරණ නියෝග නිකුත් කරන ලෙස, ගරු අධිකරණය දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

යූ.කේ.බණ්ඩාර
**අතිරේක ලේකම්(අභ්‍යන්තර කටයුතු)**
රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

පිටපත - පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව - කරු. දැ.ග.ස

ඇමුණුම 03

අභ්‍යන්තර කටයුතු අංශය
SEP 2021

1,30

රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
தேசிய பாதுகாப்பு மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சு
State Ministry of National Security and Disaster Management

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
# குடிவரவு, குடியகல்வுத் திணைக்களம்
# DEPARTMENT OF IMMIGRATION & EMIGRATION


"සුහුරුපාය" ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சுஹுருபாயா", ஸ்ரீ சுபூதிபுர வீதி, பத்தரமுல்லை, இலங்கை.
"Suhurupaya", Sri Subhuthipura Road, Battaramulla, Sri Lanka.
E-mail: controller@immigration.gov.lk


මගේ අංකය / எனது இல. / My No. : DIE/INV/92

ඔබේ අංකය / உமது இல / Your No. :

දිනය / திகதி / Date : 2021.08.17

ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය මඟින්

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණ,
කොළඹ 12.

**අධිකරණ නියෝගයන් මගින් විදේශ ජාතික චූදිතයින් ආගමන හා විගමන දෙපාර්තමේන්තු රැඳවුම් මධ්‍යස්ථාන වෙත යොමු කිරීම**

ශ්‍රී ලංකාව තුල විවිධ අධිකරණයන් මගින් නිකුත් කරනු ලබන නියෝග අනුව වැරදිකරුවන් වූ විදේශිකයන් රටින් ඉවත් කරන තෙක් රැඳවීමට මිරිහාන රැඳවුම් මධ්‍යස්ථානය පමණක් 2021.08.09 වන දින තෙක් භාවිත කරනු ලැබීය.

මෙයට අමතරව 2021.03.08 දින නිකුත් කරනු ලැබූ අංක 2218/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇලපිටිවල ග්‍රාම නිලධාරී වසමේ මිල්ලගහවත්ත නමැති ස්ථානය ද අනුමත රඳවා තැබීමේ මධ්‍යස්ථානයක් ලෙස ගැසට් කර ඇත.

දැනට ගරු අධිකරණය මගින් නියෝග නිකුත් කරනු ලබන්නේ මිරිහාන රැඳවුම් මධ්‍යස්ථානය වෙත රැඳවියන් භාර දෙන ලෙසය. ඉදිරියේ දී වැලිසර පිහිටි නව මධ්‍යස්ථානය සහ මිරිහාන යන මධ්‍යස්ථාන දෙකට ම රැඳවියන් භාර දීමට හැකි වන ලෙස අධිකරණ නියෝග ලබා ගැනීම අවශ්‍ය වේ.

එබැවින් මින් ඉදිරියට සංශෝධිත 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනතේ (351 පරිච්ඡේදය) 48 වගන්තිය අනුව රැඳවියන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමේ දී අමාත්‍යවරයා විසින් අනුමත කොට ඇති රැඳවුම් මධ්‍යස්ථානයක් වෙත යොමු කරන ලෙසට අධිකරණ නියෝගයන් නිකුත් කරන මෙන්, ගරු අධිකරණය දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

යූ. වී. සරත් රූපසිරි
පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

පිටපත - ගරු නීතිපතිතුමා - කරු.දැ.ගැ.ස.
නීතිපති දෙපාර්තමේන්තුව
අලුත්කඩේ, කොළඹ 12.


දුරකථන/தொலைபேசி / Telephone
ක්ෂණික ඇමතුම් / உடன் அழைப்பு / Hotline } 1962
පොදු / பொது / General } (+94) 11-5329000
ෆැක්ස් / பக்ஸ் / Fax } (+94) 11-2885358